# නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

## පර්යේෂණ සහකාර තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

1979 අංක 53 දරන පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම ජාතියේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම් දරන ආයතනය වේ. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කොමිසම වර්තමානයේ කොමසාරිස්වරයෙකු සහ සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

කොමිසමේ පුරප්පාඩුව පවතින පර්යේෂණ සහකාර තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### පර්යේෂණ සහකාර (තනතුරු 02)

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් භෞතික / ජීව / ඉංජිනේරු / විද්‍යාවේදී / අලෙවිකරණ / කළමනාකරණ / වාණිජවේදී / ජනසන්නිවේදන උපාධිය

**තනතුරට පැවරෙන කාර්යයන් :**

* නව නිපැයුම්, නව නිර්මාණකරුවන් හඳුනා ගැනීමේ කටයුතු
* නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමට සහාය වීම හා සම්බන්ධීකරණය
* විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති සංවිධානය, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය
* නව නිපැයුම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සහාය හා ආයතන සම්බන්ධීකරණය
* තොරතුරු හා දත්ත රැස්කිරීම, විශ්ලේෂණය හා වාර්තා පිළියෙල කිරීම

**වැටුප් පරිමාණය :**

MA 3- 2016 - රු. 32,200 - 10 X 445 - 11 X 660 - 10 X 730 - 5 X 750 - රු. 54,960

(2016.04.25 වන දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දින සිට අදාළ වේ. ඒ අනුව, ජීවන වියදම් දීමනාව හා ගැළපුම් දීමනාව සහිතව ආරම්භක වැටුප රු. 36,520.00 හිමි වේ.)

**අමතර ප්‍රතිලාභ :**

සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට පිළිවෙලින් 15% හා 3% දායකත්වයක් ලබා දේ.

**වයස් සීමාව :**

අවුරුදු 22 - 45 ත් අතර විය යුතු වේ.

**සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමේ ක්‍රමය :**

අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම්, අදාළ පළපුරුද්ද, වෘත්තීය ප්‍රවීණතා/ වෙනත් සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව මත රඳා පවතී.

තමන් විසින් සකස් කර ගන්නා ලද ජීව දත්ත තොරතුරු සහිත ඉල්ලුම්පත් 2020.10.15 වන දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය සමඟ සියලුම සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

**කොමසාරිස්,**
**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම,**
**අංක 46 & 48,**
**කොටා පාර, කොළඹ 08.**
www.slic.gov.lk, 011-2676645

Source: Dinamina, Daily News (2020.10.02)